**ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය - 2023**

**-----------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ ("අධිකාරිය") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,

- යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව අධිකාරිය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාල ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 36 හි 8 ඡේදයට පටහැනිව සමාලෝචිත වර්ෂය අවසානයට පැවති දේපල පිරියත හා උපකරණවල ධාරණ අගයෙන් හානිකරණය සඳහා ප්‍රතිපාදන ලෙස රු.2,045,756 ක් අඩුකර තිබුණි. | අධිකාරිය විසින් වර්ෂ 30ක දීර්ඝ කාලීන බදු පදනම මත ලබාගත් නාඋල ඉඩම හා ගොඩනැගිල්ල සඳහා 2012 වර්ෂයේ සිට හානිකරණ ප්‍රතිපාදන වෙන්කර ඇත. 2026 වර්ෂයේ බදු ගිවිසුම අවසන්වීමෙන් අනතුරුව අදාල ගැලපීම් මූල්‍ය ප්‍රකාශන වල සිදුකරනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව වත්කම්වල පොත් අගය ධාරණ අගයට වැඩිනම් පමණක් හානිකරණය සඳහා ප්‍රතිපාදන සිදු කල යුතුය |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 37 | | |
| | (i) ප්‍රමිතයේ 14 ඡේදයට පටහැනිව නිරවුල් නොවී ඇති නඩු 05 කට අදාලව ප්‍රති පාර්ශව විසින් ඉල්ලීම් කර ඇති වන්දි වටිනාකම රු.7,700,000 ක් උපචිත වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී වන්දි වශයෙන් ගෙවීමට ඉහල සම්භාවිතාවයක් තිබේ යන පදනම මත ගණනය කල රු.7,700,000 ක අපේක්ෂිත මුදල සඳහා වෙන්කිරීම් සිදු කර ඇත. 2023 දෙසැම්බර් 31 දිනටද මෙහි කිසිදු වෙනසක් සිදුවී නොමැති බැවින් තවදුරටත් ගෙවිය යුතු වියදම් ලෙස දක්වා ඇත. | ගිණුම්කරණ ප්‍රමිතියේ ඇතුලත් කොන්දේසි සපුරා ඇත්නම් පමණක් අසම්භාව්‍ය බැරකම් සඳහා වෙන් කිරීම් කල යුතුය. |
| | (ii)ප්‍රමිතියේ 28 ඡේදය ප්‍රකාරව අතීත ක්‍රියාවක ප්‍රතිඵලයක් ලෙස ඇති විය හැකි බැඳීමක් (Possible Obligation) වන, නඩු සම්බන්ධයෙන් ප්‍රතිපාර්ශවය විසින් ඉල්ලීම් කර ඇති වන්දි මුදල වූ රු.116,500,000 ක් අසම්භාව්‍ය බැරකම් ලෙස | ඉදිරියේදී මෙ සම්බන්ධයෙන් සටහන් මඟින් හෙළිදරව් කිරීමට කටයුතු කරනු ඇත. | අසම්භාව්‍ය බැරකම් හඳුනාගෙන ගිණුම්කරණ ප්‍රමිති 37ට අනුකූලව හෙළිදරව් කල යුතුය |

ගිණුම්කරණ සටහන් යටතේ හෙළිදරවු කර නොතිබුණි.

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ ප්‍රතිපත්තිය අනුව වත්කම්වලට අදාල හානිකරණ අලාභ වටිනාකම වාර්ෂිකව සමාලෝචනය කල යුතු වුවත්, අනෙකුත් වත්කම්, ලැබිය යුතු දැ හා තැන්පතු සහ අත්තිකාරම් සඳහා පිළිවෙලින් රු.200,000, රු.1,407,972 හා රු.1,433,947 ක් වසර හයකට අධික කාලයක සිට හානිකරණ වටිනාකම ගැලපීමකින් තොරව ගිණුම්වල දක්වා තිබුණි. | හානිකරණ අලාභ සම්බන්ධයෙන් තත්වය පරීක්ෂා කර බලා ඉදිරියේදී වෙන්කිරීම් සිදුකිරීමට පියවර ගනු ඇත. | අධිකාරියේ ගිණුම් ප්‍රතිපත්තිය අනුව හානිකරණ වටිනාකම් වාර්ෂිකව ගැලපීමට කටයුතු කල යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ කඩ කාමර 03 ක් කුලියට දීමෙන් 2019 වර්ෂය දක්වා අයවිය යුතු කඩ කුලී එකතුව රු.2,989,815 ක් ගිණුම් ගත කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂය වන විට ලෝක වෙළඳ මධ්‍යස්ථානයෙහි පිහිටි ආයතන 03 සඳහා නීතිමය පියවර ගෙන ඇති බැවින්, ගිවිසුම් ප්‍රකාරව හා ලැබිය යුතු වටිනාකම් නීතිමය තීරණයන් මත පදනම් වන හෙයින්, 2023 දෙසැම්බර් 31 දින ලැබිය යුතු වටිනාකම් දක්වා නොමැති අතර, ඉදිරි වර්ෂයේදී අදාල ලැබිය යුතු වටිනාකම් දැක්වීමට කටයුතු කරනු ලැබේ. | ලැබිය යුතු ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය |
| (ආ) | විගණනයේ ගණනය කිරීම් අනුව 2023 දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත් ලැබිය යුතු පොලිය රු.16,568,170 කින් වැඩියෙන් ගිණුම් ගත කර තිබුණි. | පොලී ආදායම වැඩියෙන් ගිණුම්ගත කර ඇති ස්ථාවර තැන්පතු සඳහා සියයට 12 පොලී අනුපාතය අදාල කර ගනිමින් සහ අඩුවෙන් ගණනය කල ස්ථාවර තැන්පතු සඳහා පොලී අනුපාතය සියයට 10 අදාල කර ගනිමින් ලැබිය යුතු අගය ගණනය කර ඇත. | ලැබිය යුතු ආදායම් නිවැරදිව ගණනය කර ගිණුම් ගත කළ යුතුය. |
| (ඇ) | වැටලීම් සඳහා ත්‍යාග වශයෙන් ගෙවිය යුතු රු.62,483,470 ක් වගකීම් ලෙස පෙන්විය යුතු වුවද, එම මුදල මැණික් ත්‍යාග අරමුදල නමින් හිමිකම් යටතේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති අතර වැටලීම් සඳහා සම්බන්ධ වූ බාහිර පාර්ශව වෙත මෙම ත්‍යාග මුදල් බෙදා දීම සිදු කර නොතිබුණි. | මැණික් ත්‍යාග අරමුදල අධිකාරියේ අරමුදල් යටතේ වර්ග කොට ඇති බැවින්, මූල්‍ය ප්‍රකාශන වල හිමිකම් යටතේ වර්ග කොට ඇත. | ගෙවිය යුතු ත්‍යාග මුදල් හිමිකම් ලෙස හඳුනානොගත යුතු අතර වගකීම් ලෙස ගිණුම්ගත කල යුතුය. ගෙවිය යුතු ත්‍යාග මුදල් නොපමාව |

| | | | |
|---|---|---|---|
| | | | ගෙවා නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ තහවුරු කිරීම් අනුව අයවිය යුතු තැම්පත් මුදල රු.16,368,300 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව රු.15,802,290 ක් වීමෙන් රු.566,010 ක වෙනසක් නිරීක්ෂණය විය. | ලෝක වෙළඳ මධ්‍යස්ථාන සමාගමෙන් අයවීමට නියමිත රු.16,368,300 ක තැන්පතු මුදලට අදාල වන පරිදි මූල්‍ය ප්‍රකාශන වල විවිධ තැන්පතු ශේෂය ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | නිවැරදි වටිනාකම් තහවුරු කරගෙන ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ඉ) | රඳවා ගැනීම් බදු ගෙවීම් කිරීමේදී එය පතල් තැම්පතු වගකීම් ගිණුමට ගිණුම්ගත කිරීමේ වරද නිවැරදි කිරීමේ සටහන දෙවරක් යෙදීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට රු.8,298,412 ක් ගෙවිය යුතු රඳවා ගැනීම් බදු අඩුවෙන් හා පතල් තැන්පතු වැඩියෙන් දක්වා තිබුණි. | 2024 ගිණුම් වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | අදාල නිවැරදි කිරීම් නිවැරදිව සිදුකළ යුතුය. |

**1.5.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

| විෂයය | මුදල (රු) | නොසැපයු විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| i. පොළී ආදායම | 451,383,305 | උපලේඛන | i. අදාල උපලේඛණය සටහන් සමග ඉදිරිපත් කල අතර නැවත ඉදිරිපත් කරමි. | පොලී ආදායම් ගණනය කිරීමේ උපලේඛණය ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| ii. සියයට 10 රඳවා ගැනීම් | 2,568,873 | | ii. 2009 ජනවාරි 01 දිනට පෙර පැවති රඳවා ගත් ශේෂ පිළිබඳ තොරතුරු 2023 වර්ෂයේදීද අනාවරණය කර ගැනීමට නොහැකි වූ අතර 2024 වර්ෂයේදී එම ශේෂ අනාවරණය කොට ඉදිරිපත් කිරීමට කටයුතු කරණු ඇත. | රඳවාගත් ශේෂ පිළිබඳ විස්තරාත්මක තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| iii. තැන්පතු හා අත්තිකාරම් | 132,928,418 | | iii. බිම් පංගු තැන්පතු පිළිබඳ තොරතුරු අදාල ප්‍රාදේශීය කාර්යාලයේ බිම්පංගු ලේඛණ පරීක්ෂාවෙන් ලබාගත | තැන්පතු හා අත්තිකාරම් පිළිබඳ උපලේඛණ විගණනයට |
| | **586,880,596** | | | |

| | | | |
|---|---|---|---|
| | | හැක. ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ ආරක්ෂක තැන්පතු හා කුලී තැන්පතු සම්බන්ධ උපලේඛණ නිවැරදි කොට ලබාදීමට කටයුතු කරනු ඇත. | ඉදිරිපත් කල යුතුය |

**1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරිය විසින් ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ කඩ කාමර කුලියට ගැනීමට එකග වී තිබූ බදු කුලී ගිවිසුම 2021 ඔක්තෝබර් 31 දිනෙන් අවසන් කර තිබුණි. එසේ වුවද, ලබාදී තිබූ රු.16,368,300 ක ආරක්ෂිත ඇප තැන්පතුව 2024 පෙබරවාරි 28 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. | ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ පිහිටා තිබූ ශ්‍රී ලංකා මැණික් සහ ස්වර්ණාභරණ භුවමාරු මධ්‍යස්ථානය සඳහා සමාගම සමඟ ඇති කර ගෙන තිබූ කුලී ගිවිසුම 2021 ඔක්තෝබර් 31 දිනෙන් අවසන් කරන ලදී. එසේ වුවද රු.16,368,300 ක ආරක්ෂිත ඇප තැන්පතු නිදහස් කර ගැනීමට නම් සියළු සාප්පු නිරවුල් බුක්තියෙන් එම ආයතනය වෙත ලබා දිය යුතුව තිබුණද එක් සාප්පුවක් සඳහා අධිකරණය විසින් සාප්පුව භාරදෙන ලෙසටත්, හිඟ මුදල් ගෙවන ලෙසටත් නියෝග කර ඇතත් සාප්පු හිමිකරු විසින් අධිකරණ නියෝගය අනුව මෙතෙක් ක්‍රියාකර නොමැත. | ආරක්ෂිත ඇප තැන්පතුව ආපසු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විවිධ ණය හිමියන් තුල රු.64,447,721 ක ගෙවිය යුතු ශේෂයක් වසර 05 කට අධික කාලයක සිට නිරවුල් නොකර පැවතුනි. | වතු සමාගම් වල මැණික් ඉඩම් වෙන්දේසි හා විවිධ මැණික් ගැරීම් ව්‍යාපෘති වලින් ලද ආදායමෙන් විවිධ ණයහිමියන්ට ගෙවිය යුතු වූ මුදල් සම්බන්ධයෙන් මතුවී ඇති නීතිමය ගැටළු මත මෙම ගෙවීම් මේ දක්වා සිදුකර නොමැත. මෙම නීතිමය ගැටළු නිරාකරණය වූ විගස මෙම ගෙවීම් නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත. | ණයහිමි ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | (අ) 1993 අංක 50 දරන ජාතික මැණික් හා | | | |

| | | | |
|---|---|---|---|
| ස්වර්ණාභරණ අධිකාරිය පනත | | | |
| (i) 15(1) වගන්තිය | මෙම වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාව තුල මැණික් කර්මාන්තය කරගෙන යාම සඳහා බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධව වගකිව යුතු එකම බලධාරියා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වන නිසා මැණික් කර්මාන්තයට අදාළ ප්‍රධාන නියාමන අධිකාරිය තුන්වන පාර්ශවය සමඟ සෘජුවම මැණික් ගැරීමේ ව්‍යාපෘතිවල නියැලීම පනතට පටහැනි බවට නීතිපති දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී තිබුණත් සමාලෝචිත වර්ෂය තුල මැණික් ගැරීම් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණි. | මෙහිදී අධිකාරිය විසින් මැණික් ගැරීම සිදු නොකරන අතර තුන්වන පාර්ශවය (වසමේ සමෘද්ධි ප්‍රජා මූල සමිති) විසින් සිදු කරන කටයුතු අධීක්ෂණය හා පනතේ 18 (2) වගන්තිය ප්‍රකාරව ලැබෙන මැණික් නිසිලෙස භාරගෙන වෙන්දේසි කොට අදාල රාජ්‍යභාගය ලබා ගැනීම පමණක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඇතිව අධිකාරිය විසින් සිදු කරනු ලබයි.<br>අදාල කරුණ සම්බන්ධයෙන් විවිධ මත ඉදිරිපත් වූ අතර අවසානයේ අධිකාරිය විසින් සෘජුව මැණික් ගැරීමේ කාර්යයේ නියැලීමකින් තොරව 15 (1) වගන්තිය ප්‍රකාරව තුන්වන පාර්ශවයක් වෙත මැණික් ගැරීම් බලපත්‍රයක් නිකුත් කොට ලැබෙන මැණික් වලින් පනතේ 18 (2) වගන්ති ප්‍රකාරව රාජ්‍ය භාගය අයකර ගැනීම සම්බන්ධව ගිවිසුම්වලට එළඹ කටයුතු කිරීම සම්බන්ධයෙන් බාධාවක් නොමැති බවට නීතිපති දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ ලබා දී ඇත. | පනතේ විධිවිධාන ප්‍රකාරව අධිකාරිය විසින් සෘජුවම මැණික් ගැරීමේ කටයුතු වල නිරත නොවිය යුතුය. |
| (ii) 15(2) වගන්තිය | මැණික් පරීක්ෂා කිරීම හා සහතික නිකුත් කිරීම සඳහා පවත්වාගෙන යන පෞද්ගලික රසායනාගාර ලියාපදිංචි කිරීමට හා නියාමනය කිරීමට ක්‍රමවේද සකස් කර නොතිබුණි | ගැසට් කෙටුම්පත අමාත්‍යාංශ ලේකම් තුමියගේ අත්සනින් යුතුව දෙමළ හා ඉංග්‍රීසී පරිවර්තනයන්ද සමඟ 2023 නොවැම්බර් 17 වන දින නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇත. නෛතික ගැටළු නිරාකරණය කර ගැනීමෙන් අනතුරුව ගැසට් පත්‍රය නිකුත් කර මැණික් රසායනාගාරය ලියාපදිංචි කිරීම සඳහා බලපත්‍ර ලබාදීමට කටයුතු කරනු ඇත. | පනතේ විධිවිධාන ප්‍රකාරව මැණික් පරීක්ෂා කිරීමේ රසායනාගාර ලියා පදිංචි කිරීමට හා නියාමනයට කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | (iii) 20(1) හා 20(2) වගන්ති | අධිකාරියෙහි බලතල කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේදී හා ඉටු කිරීමේදී අධිකාරිය වෙත ලැබෙන මුදල් හා පරිත්‍යාග ප්‍රධාන අරමුදලට බැර කලයුතු වුවත්, ඉන් බැහැරව 2023 දෙසැම්බර් 31 දිනට මැණික් ත්‍යාග හා මැණික් ගැරීම් සුහසාධන අරමුදල් දෙකට මුදල් බැර කිරීමෙන් පිලිවෙලින් රු.62,483,470ක් හා රු.38,126,472ක් වූ ශේෂයන් පැවතුණි. | අධිකාරිය මඟින් පවත්වාගෙන යනු ලබන මැණික් ත්‍යාග අරමුදල හා මැණික් ගැරීම් සුහසාධන අරමුදලේ තොරතුරු සෑම කාර්තුවකදීම මහා භාණ්ඩාගාරය වෙත ලබාදීම සිදුකරනු ලබයි. | පනතේ විධිවිධාන ප්‍රකාරව ලැබෙන මුදල් අධිකාරියේ අරමුදලට බැර කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ අංක 86 සහ දේශීය ආදායම් කොමසාරිස්ගේ අංක SEC/2022/E/03 දරන 2022 දෙසැම්බර් 23 දිනැති රඳවා ගැනීම් අනු නියෝජිතයන් වෙත නිකුත් කල රඳවා ගැනීම් බද්ද සහ අත්තිකාරම් බදු අඩු කිරීම චක්‍රලේඛයේ අංක 06 ඡේදය | සෑම රඳවා ගැනීම් අනුනියෝජිතයකු විසින්ම එකතුකළ රඳවා ගැනීම් බදු එක් එක් ලිත් මාසය අවසාන වී දින 15ක් ඇතුලත දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට ප්‍රේෂණය කලයුතු වුවත්, අධිකාරිය විසින් 2023 නොවැම්බර් 30 දින දක්වා එකතු කරන ලද රඳවා ගැනීම් බදු රු.690,476,013 ක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2023 වර්ෂයට අදාල රඳවා ගැනීමේ බදු (මැණික් වෙන්දේසි සඳහා සියයට 2.5 රඳවා ගැනීමේ බදු හැර) එළඹෙන මාසයේ 15 ට ප්‍රථමව ගෙවා ඇත. මැණික් වෙන්දේසි සඳහා අදාල සියයට 2.5 ක රඳවා ගැනීමේ බදු ඉන්වොයිස්පත්‍ර අදාල ප්‍රාදේශීය කාර්යාලයෙන් ලැබුණු පසු දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කරනු ලබන අතර ඉදිරියේදී සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුලම ගෙවීම් කිරීමට කටයුතු කරනු ලැබේ. | දේශීය ආදායම් පනත ප්‍රකාරව රඳවා ගැනීම් බදු ප්‍රේශණය කිරීමට කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.995,430,030 ක ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ලාභය රු.425,741,708 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.569,682,322 ක වර්ධනයක් නිරීක්ෂණය විය. කාලච්ඡේදය තුලදී පරිපාලන වියදම් රු.58,987,235 කින් වැඩි වී තිබු නමුත් මැණික් ඉඩම් වෙන්දේසි ආදායම රු.202,121,358 කින් හා පොලී අදායම් රු.323,065,776 කින් වැඩි වී තිබීම මෙම වර්ෂයේ ලාභය වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ පනත කාලානුරූපීව සංශෝධනය කර ගැනීමට සමාලෝචිත වර්ෂයේද පියවර ගෙන නොතිබුණි. | 2023 ජූලි 06 දිනැතිව මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය විසින් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරී පනත සහ පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත අහෝසි කර ඒ වෙනුවට නියාමන කර්තව්‍යයන් ඉටු කිරීම, පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් නව ආයතන දෙකක් හා ඊට අදාළ නෛතික පනත් හඳුන්වාදීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇත. එබැවින් 1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනත සංශෝධනය කිරීම අවශ්‍ය නොවන බවට මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය විසින් සිය නිරීක්ෂණ මඟින් දක්වා ඇති බැවින් ඊට අදාළව කටයුතු කරන ලෙසට කර්මාන්ත අමාත්‍යාංශ ලේකම් වෙත නියම කිරීමට අංක අමප/23/1392/617/029 සහ 2023 අගෝස්තු 15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් තීරණය වී ඇති බව ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් විසින් අංක SMGJ/ADM/03/01/05 සහ 2023.10.04 දිනැති ලිපියෙන් අධිකාරිය වෙත දැනුම් දී ඇත. | අදාල අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා මේ දක්වා අනුමැතිය ලැබී නොමැති බැවින් දැනට ක්‍රියාත්මක පනත කාලානුරූපීව සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පිරිවැය වටිනාකම රු.9,724,501 ක් වූ මැණික් ගල් තාපකරණයට ලක් කිරීම හඳුනා ගැනීමේ FTIR යන්ත්‍ර දෙකක් අවිධිමත් කළමනාකරණය හේතුවෙන් භාවිත කල නොහැකි තත්වයේ පවතී. | FTIR යන්ත්‍ර දෙක කොළඹ මැණික් රසායනාගාරයේ හා රත්නපුර රසායනාගාරයේ ස්ථාපිතව ඇත. ඒ අනුව මෙම යන්ත්‍ර දෙක නිසි ක්‍රියාකාරිත්වයේ නොතිබුනද එහි පැවැත්ම වෙනුවෙන් අනිවාර්ය අවශ්‍යතාවයක් වශයෙන් නියමිත උෂ්ණත්වය සැපයීම සඳහා සුදුසු උපකරණ පරිපාලන අංශය මගින් සැපයිය යුතු සේවාවක් වේ. එබැවින් පැය 24 පුරා එම යන්ත්‍ර දෙක සඳහා වායු සමීකරණ පහසුකම් ලබාදීමට කටයුතු කර ඇත. | වත්කම් නිසි ක්‍රියාකාරී තත්වයෙන් පවත්වා ගනිමින් මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කළ යුතුය. |
| (ඇ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කල බඳවා ගැනීම් පරිපාටිය අනුව ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ සියලුම පරිපාලන, මුල්‍ය හා නියාමන කටයුතු සම්බන්ධයෙන් සභාපතිවරයාට සහයවීම ඇතුළුව වැඩි වගකීම් | 2022 දෙසැම්බර් 09 දින අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ පුරප්පාඩුව පිරවීම සඳහා සම්මුඛ පරීක්ෂණය පවත්වන ලදී. නමුත් එහිදී ඉදිරිපත් වූ අයඳුම්කරුවන් සම්බන්ධයෙන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සෑහීමකට පත් නොවීම හේතුවෙන් එම සම්මුඛ පරීක්ෂණය අසාර්ථක විය. එබැවින් ද්විතියින සහ කොන්ත්‍රාත් පදනම මත 2013 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා නිලධාරීන් 12 දෙනෙකු අධිකාරියේ අධ්‍යක්ෂ | බඳවා ගැනීම් පටිපාටියේ අවශ්‍ය සංශෝධනයන් සිදුකර ගෙන අධ්‍යක්ෂ ජනරාල් තනතුර ස්ථිරව පුරවා ගැනීමට |

| | | |
|---|---|---|
| කොටසක් දරන අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා 2013 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වසර 10 කට වැඩි කාලයක් ස්ථිර පදනමින් නිලධාරියෙකු බඳවාගෙන නොතිබුණි. | ජනරාල් තනතුර සඳහා පත් කිරීම විෂයභාර අමාත්‍යවරයා වෙත අධිකාරී පනතෙන් පැවරී ඇති බලතල යටතේ සිදුකර ඇත. | කටයුතු කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ 2018 අගෝස්තු 29 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛ අංක NGJA/16.2/2018/Bachoe iii හි 07 ඡේදය අනුව මැණික් කැණීම හා ගැරීමෙන් පසු භූමිය යථාවත් කර ඇප මුදල් ඉල්ලා සිටීම සිදු කල යුතු වුවත්, එසේ සිදු කර නොමැතිව අනතුරුදායක ලෙස සහ පරිසරයට හානිකර ආකාරයට අතහැර දමා ඇති අවදානම් සහගත පතල් වලවල් බලපත්‍රය අවලංගු වී මාස 02 කින් පසුව අධිකාරිය විසින් වසා දමා භූමිය යථාවත් කල යුතු වුවත්, නියැදි පරීක්ෂාවේදී එසේ වසා දමා නොමැති පතල් වලවල් 19 ක් නිරීක්ෂණය විය. | මේවා දැනට වසර 10 කට පමණ පෙර මැණික් ගැරීමට අමතරව විවිධ කාර්යයන් සඳහා (වැලි/පස්) යොදා ගත් ඉඩම් වන බවත් බලපත්‍ර ලබා ගත් නිශ්චිත පුද්ගලයන් පිළිබඳ විස්තර අධිකාරිය සතුව නොතිබූ බවත් ලේඛන පරීක්ෂා කිරීමේ දී අනාවරණය වී ඇත. එම වලවල් වසා ඉදිරි කටයුතු කිරීමට අදාල අංශය වෙත යොමු කර ඇත. | චක්‍රලේඛයේ නියමයන් අනුව පතල් වලවල් වසා අදාල භූමිය නිසි ලෙස ප්‍රතිසංස්කරණය කල යුතුය. ඒ සඳහා ප්‍රමාණවත් ඇප මුදලක් ලබා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | මැණික් ගැරීම් බලපත්‍ර නිකුත් කිරීමේදී කැනීම් කරනු ලබන මැණික් පතල්වලට නැවත පුරවා ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් විශේෂ ආරක්ෂණ ඇපයක් අයකරන අතර සමාලෝචිත වර්ෂය අවසානයට පතල් කැණීම්කරුවන් විසින් අවස්ථා ගණනාවකදී තැන්පත් කර ආපසු ලබා නොගත් ආරක්ෂණ ඇප තැන්පතු වටිනාකම රු.1,377,385,852 ක් වීම හේතුවෙන් නියමිත පරිදි මැණික් පතල් වලවල් වසා අදාල භූමි නිසි ලෙස ප්‍රතිසංස්කරණය කිරීම පිළිබඳව නිසි නියාමනයක් සිදුවී තිබේද යන්න විගණනයේදී මතභේදයට තුඩු දී තිබුණි. | සාම්ප්‍රදායික පතල් සඳහා අයකරනු ලබන ඇප මුදල් මෙම ශේෂයෙන් පෙන්නුම් කරනු ලබන අතර එය 2023.03.22 දින සිට එක් පතලක් සඳහා රු. 10,000 ක් ද ඊට පෙර වර්ෂයන්හිදී එක් පතලක් සඳහා රු. 4500 ක් ද වශයෙන් අයකරනු ලැබීය. මෙලෙස අයකරනු ලබන ඇප මුදල ඉතා අඩු අගයක් ගන්නා බැවින් පතල් කරුවන් විසින් සම්ප්‍රදායික පතල් වසා දැමීමට කටයුතු කරනු ලැබුවද ඇප මුදල් නැවත ඉල්ලා නොසිටින හෙයින් මෙලෙස ශේෂයක්ව පවතී. | පනතේ නියමයන් අනුව මැණික් පතල් වලවල් වසා අදාල භූමි නිසි ලෙස ප්‍රතිසංස්කරණය කල යුතුය. ඒ සඳහා ප්‍රමාණවත් ඇප මුදලක් ලබා ගැනීමට කටයුතු කල යුතුය. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌණ උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| බෙලිදෙණියෙහි, පිරිවැය රු.889,000 ක ඉඩම හා පිරිවැය රු.5,358,507 ක ගොඩනැගිල්ල වසර 12 කට වැඩි කාලයක සිට කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යව පැවතුනි. | 2024 ජනවාරි 31 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කරන ලද අංක 2430 දරන මාණ්ඩලික පත්‍රිකාව අනුව බෙලිදෙනිය ඉඩම හා ගොඩනැගිල්ල මැණික් සහ ස්වර්ණාභරණ පර්යේෂණ අභ්‍යාස ආයතනයේ සභාපතිතුමා විසින් එම ආයතනයේ භාවිතය සඳහා ලබාදෙන ලෙස යෝජනා කර තිබුණි. | මෙම වත්කම් ඵලදායී කටයුත්තකට භාවිතා කිරීමට කටයුතු කල යුතුය. |

## 3.4 ව්‍යාපෘති ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අධිකාරිය විසින් රු.මිලියන 19 ක පිරිවැයකට මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීමට 2016 වර්ෂයේදී මෘදුකාංග සැපයුම් සමාගමක් සමඟ ගිවිසුම්ගත වී 2021 වර්ෂය දක්වා රු.10,450,000 ක් ගෙවා තිබුණි. ගිවිසුම්ගත වී වසර 07 කට අධික කාලයක් ගතවී ඇති නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීම අවසන් කර නොතිබුණි. | මෘදුකාංග සංවර්ධන ආයතනය මඟින් 31/12/2023 වන විට මෘදුකාංගයේ සියලුම කොටස් සංවර්ධනය කර අවසන් බවට දන්වන ලදී. අධිකාරියේ පරිගණක අංශය විසින් ERP මෘදුකාංගය ක්‍රියාත්මක වන සියලුම අංශ ප්‍රධානීන්ගෙන් මෘදුකාංග ක්‍රියාකාරීත්ව සහ මූලික පිරිවිතරයන්ට ගැලපීම සම්බන්ධ වාර්තාවක් ලබා ගන්නා ලදී. සංවර්ධනය නොවූ කොටස් සඳහා දින 90ක කාලයක් ඉල්ලුම් කර තිබුණි. | පිරිවැය වැඩිවීම, පද්ධතිය යල්පැනීම හා වැය කළ මුදලට ප්‍රතිලාභ නොමැතිවීම යන හේතු මත අදාල මෘදුකාංග පද්ධතියේ කටයුතු කඩිනමින් නිම කිරීම අවශ්‍ය වේ. |